# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

නො: 07, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07.
இல: 07, ஹெக்டர் கொப்பெகடுவ மாவத்தை, கொழும்பு 07.
No: 07, Hector Kobbekaduwa Mawatha, Colombo 07.

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2684051
ඊමේල් / ஈ-மெயில் / E-mail: info@landcommdept.gov.lk


මගේ අංකය / எனது இல / MY NO: චක්‍රලේඛ අංක - 2/2011
ඔබේ අංකය / உமது இல / YOUF NO:
දිනය / திகதி / DATE: 2011.03. 15

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් වෙත
නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (අන්තර් පළාත්) වෙත සහ
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>රජය සතු ඉඩම් අල්ලාගැනීම පාලනය කිරීම හා කළමණාකරණය විධිමත් කිරීම.</u>**

උක්ත කරුණට අදාළව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද එල්ඩී-1-34(1) සහ 2008.06.13 දිනැති චක්‍රලේඛය අනුව මවිසින් නිකුත් කරන ලද 2008/4 චක්‍රලේඛය සම්බන්ධවයි.

02. රජය සතු ඉඩම් අනවසරයෙන් අල්ලාගැනීම අධෛර්ය කිරීම අරමුණු කරගෙන උක්ත චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් ප්‍රතිපත්ති මාලාව අනුව ඉඩම් කච්චේරි පවත්වා විධිමත්ව පුද්ගලයන් තෝරා නොගෙන අනවසර නියමානුකුල කිරීමේ පදනම මත පුද්ගලයන් වෙත දීර්ඝකාලීන බදු නිර්දේශ තවමත් මා වෙත ඉදිරිපත් කරන බව නිරීක්ෂණය වී ඇත. 1995.06.15 දිනට ප්‍රථම රජයේ ඉඩම් අල්ලාගත් පුද්ගලයන්ට අදාල ඉඩම් නීත්‍යානුකූල කිරීම සඳහා දීර්ඝ කාලසීමාවක් දැනටමත් ලබා දී ඇති බැවින් තවදුරටත් එවැනි ඉඩම් ඇතැයි සලකමින් දීර්ඝකාලීන බදු අනුමත කිරීම මගින් 2008/4 චක්‍රලේඛයේ උපදෙස් ක්‍රියාත්මක වීම මගහැරෙන බැවින් මින් ඉදිරියට අනවසර නියමානුකූල කිරීමේ පදනම මත දීර්ඝ කාලීන බදු නිර්දේශ ඉදිරිපත් නොකරන මෙන් කාරුණිකව දන්වමි. අනවසර නියමානුකූල කිරීමේ පදනම මත දීර්ඝකාලීන බදු නිර්දේශ කර දැනටමත් මා වෙත ඉදිරිපත් කර ඇති ලිපිගොනු වලට අදාල ඉඩම් බෙදාදීම සුදුසු නම් හා නියමිත සුදුසුකම් සපුරන්නේ නම්, සුදුසු පුද්ගලයන් 2008/4 චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව තෝරා ගෙන නිර්දේශ ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් දන්වමි. එවැනි ලිපිගොනු වලට අදාලව විධිමත්ව තෝරාගත් බව සනාථ වන ලේඛන ද සමග 19 පරිශිෂ්ය වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. මින් ඉදිරියට දීර්ඝ කාලීන බදු පුද්ගලයන් විසින් ඉදිරිපත් කිරීමේ දී 2008/4 චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව නිර්දේශ ඉදිරිපත් කරන ලෙසත්, අනවසර පදනමින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සඳහා අනුමැතිය ලබා නොදෙන බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්.පී.ආර්.රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:

1. ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා } - කාරුණික දැ.ගැ.ස
2. ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා }
3. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - ඔබගේ අංක එල්ඩී/4/1/19 හා 2011.03.03 දිනැති ලිපිය අනුව දැ.ගැ.ස.
4. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
5. සියළුම ප්‍රධාන ලේකම්වරුන්
6. මැනුම්පති
7. පළාත්සභා වල ඉඩම් විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරුන්
8. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
9. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
10. කොමසාරිස් ජනරාල්, ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
11. අධ්‍යක්ෂ, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය

nkl